(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක. 447.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 අප්‍රේල් මස 08 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4803/'14

1.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අ. පො. ස (උසස් පෙළ) සහ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයින්ගේ සේවා වියුක්ති අනුපාතය කොපමණද;

(ii) 2013 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ පැවති සමස්ත සේවා වියුක්ති අනුපාතය කොපමණද;

(iii) සේවා වියුක්ති අනුපාතය ගණනය කරන ක්‍රමවේදය කවරේද;

(iv) උගත් පුද්ගලයින්, තරුණ පරපුර සහ කාන්තාවන් අතර සේවා වියුක්තිය ඉහළ ගොස් ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4827/'14

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට ශ්‍රී ලංකා නාවික හමුදාවේ රාජකාරි සඳහා කුලී පදනම මත, වායුසමනය කළ, සුඛෝපභෝගී වාහන ලබා ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ආ) (i) එසේනම්, ලබා ගෙන ඇති එම වාහන වර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වායුසමනය කළ වාහනයක් සඳහා ගෙවන මාසික කුලිය එකී වාහන වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) සාමාන්‍ය ආරක්ෂක රාජකාරි සඳහා එම වාහන යොදා ගන්නේද;

(ii) නොඑසේ නම්, නිලධාරීන්ගේ ගමන් බිමන් සඳහා එම වාහන යොදා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාව කුලී පදනම මත ලබාගත් වායුසමනය කළ සුඛෝපභෝගී වාහන සඳහා මසකට ගෙවනු ලබන කුලිය;

(ii) 2012 සහ 2013 වර්ෂයන්හි ඉහත වාහන සඳහා ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5424/’14

3\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවේ පුහුණු ශිල්පී මූලික සේවා ව්‍යවස්ථාවට අනුව, 1997.01.01 දින සිට සියලුම පුහුණු ශිල්පීන් එම සේවාවට අන්තර්ග්‍රහණය කර ඇති බව දන්නේද;

(ii) වෙනත් කිසිදු සේවා ව්‍යවස්ථාවක නොමැති කොන්දේසියක් ලෙස මෙම සේවාවේ කාණ්ඩ සහ උසස්වීම අනුව "අ" කාණ්ඩයේ සිටින ශිල්පීන්ට පළමුවැනි පන්තිය සඳහා උසස්වීම් ලබාදීමේදී 6:1 අනුපාතය අනුගමනය කරනු ලබන්නේද;

(iii) එම අනුපාතය 6/2006 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී වෙනස් කරන බවට අවස්ථා කීපයකදී බලධාරීන් විසින් එකඟ වී ඇති බව දන්නේද;

(iv) නමුත්, මේ වනතුරුත් 6/2006 චක්‍රලේඛය අනුව උසස්වීම් පටිපාටියක් සකස් කිරීමට අපොහොසත්වී තිබේද;

(v) එසේ නම්, එයට හේතු කවරේද;

(vi) මෙම ගැටලුව නිසා වැටුප් වර්ධක උපරිම සීමාවේ රැඳී සිටින විශාල සේවක පිරිසකට ද අසාධාරණයක් සිදුවන බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5448/’14

4\.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2009 සිට 2013 දක්වා පස් වසරක කාල සීමාව තුළ ජාතික ලොතරැයි මණ්ඩලය විසින් උපයන ලද ලාභය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය මගින් පවත්වාගෙන යන ලොතරැයි වර්ග කවරේද;

(ii) පසුගිය වාරයේ දිනුම් අදින ලද මෙගා ලොතරැයිය පිළිබඳව ප්‍රචාරය කළ පරිදි, පළමු දිනුමට රුපියල් කෝටි 5කුත්, සෙසු තෑගි ලෙස ජීප් රථ 40කුත් දිනුම් ඇදීමෙන් පසු ජයග්‍රාහකයන්ට ලබා දුන්නේද;

(iii) මේ වන විට සෙසු එක් එක් ලොතරැයිය දිනුම් ඇද ප්‍රකාශයට පත් කරන දිනුම් සංඛ්‍යාව හා ප්‍රදානය කරන ලද ත්‍යාග මුදල අඩු කර තිබේද;

(iv) එසේ අඩු කර ඇත්නම්, එහි සංඛ්‍යාත්මක අගය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5580/’14

5\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආයුර්වේද වෛද්‍යවරු සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන සේවා ව්‍යවස්ථාව සකසන ලද වර්ෂය කවරේද;

(ii) එම සේවා ව්‍යවස්ථාව අවසන් වරට සංශෝධනය කළ වර්ෂය කවරේද;

(iii) එය සංශෝධනය නොකළේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5846/'14

6.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ, අංක R/0682/T/036 යටතේ ලියාපදිංචි ජුම්ආ දේවස්ථානයට අවසන්වරට නීත්‍යානුකූලව භාරකරුවන් පත්කරන ලද දිනය කවරේද;

(ii) එම භාරකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් දේවස්ථානයට අයත් නිශ්චල දේපළ (ඉඩම්, නිවාස හා වෙළඳසැල්) සංඛ්‍යාව කොපමණද;

(ii) එම දේපලවලට අයත් හිමිකම්පත් (ඔප්පු) දේවස්ථානය නමින් තිබේද;

(iii) එම එක් එක් දේපළ කුලී පදනම මත හෝ බද්දට ලබාදීමේදී වකුෆ් පනතේ සඳහන් විධිවිධාන පරිදි ගිවිසුම් අත්සන් කර තිබේද;

(iv) එසේ නම්, එම ගිවිසුම් අත්සන් කළ දින සහ අදාළ බදුකරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් එක් එක් දේපළ, බදු හෝ කුලී පදනම යටතේ ලබාදීම සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ අනුමතිය ලබාදී තිබුනේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5897/'15

7.

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා,— මුස්ලිම් ආගමික කටයුතු හා තැපැල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන අධිශ්‍රේණි තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) අවිස්සාවේල්ල මැතිවරණ කොට්ඨාසයේ, සීතාවකපුර නව අධිශ්‍රේණි තැපැල් කාර්යාලය සඳහා ගොඩනැගිලි පහසුකම් සම්පූර්ණ කර තිබේද;

(iii) එසේ නම්, එම අධිශ්‍රේණි තැපැල් කාර්යාලය එළැඹෙන සිංහල අලුත් අවුරුද්දට පෙර ජනතා අයිතියට පත් කොට සේවාවන් සැපයීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අවිස්සාවේල්ල තැපැල් බලප්‍රදේශය, සීතාවක තැපැල් බලප්‍රදේශය ලෙස නම් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඉහත (අ) (ii) හි සඳහන් තැපැල් කාර්යාලය විවෘත කිරීමත් සමග අදාළ බලප්‍රදේශය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4828/'14

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර මහ රෝහලට තම ප්‍රථම පත්වීම ලැබූ එහි ප්‍රධාන හෙද නිලධාරිනිය වන මල්කාන්ති ද සිල්වා මහත්මිය මේ වන විට ස්ථාන මාරුවීම්වලින් තොරව එම රෝහලේම වර්ෂ 21 ක් පමණ සේවය කර ඇති බවත්;

(ii) එම හෙද නිලධාරිනිය අවස්ථා කිහිපයකදී ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රජයේ හෙද සේවයේ නියුතු වූ අයට ස්ථාන මාරුවීම් ලබා දීමේදී රජය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය කවරේද;

(ii) ඉහත අ (ii) හි පරිදි ස්ථාන මාරුවීම ඉල්ලා තිබියදීත්, රජයේ හෙද ස්ථාන මාරු ලබා දීමේ ප්‍රතිපත්තිය මල්කාන්ති ද සිල්වා මහත්මියට වලංගු නොවීමට හේතු කවරේද;

(iii) අදාළ ස්ථාන මාරුවීම් ලබා දීමේ ප්‍රතිපත්තියට අනුව ඇයට ස්ථාන මාරුවීමක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඇයට, ඇය ඉල්ලුම් කරන ස්ථානයට ස්ථාන මාරුවීමක් දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4834/'14

9.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත තුළ පිහිටා ඇති සමස්ත පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා අතරින් මධ්‍යම රජය විසින් හා පළාත් සභාව විසින් පාලනය කරනු ලබන පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වයඹ පළාතේ මේ වන විට වැසී ගොස් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පළාතේ නැවත විවෘත කරන ලද පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5581/'14

10.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් ආයුර්වේද වෛද්‍ය කොමසාරිස්වරයාගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම නිලධාරියාට ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් ඇති සුදුසුකම් කවරේද;

(iii) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරියෙකුට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තුළ ලබා ගත හැකි ඉහළම වෘත්තීයමය තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4829/'14

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරගොඩ උයන්ගොඩ I අත හා II අත ඇතුළු ග්‍රාම නිලධාරී වසම් කිහිපයක වගා අස්වනුවලට වඳුරන්ගෙන් සහ මොනරුන්ගෙන් සිදුවන හානි වළක්වාගත නොහැකි වීම නිසා කෘෂිකාර්මික කටයුතුවල නියුතු ප්‍රදේශවාසීන් දැඩි අපහසුතාවට පත්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වගාවන්ට සිදුවන හානි වැළැක්වීම සඳහා දැනට ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා ඉදිරියේදී අනුගමනය කරන ක්‍රමවේදයන් කවරේද;

(iii) මෙම වගාවන් ආරක්ෂා කරදීම සඳහා කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4835/'14

12.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමානයේ වයඹ පළාත තුළ සිටින පාසල් ළමුන් සංඛ්‍යාව කොපමණද;

(ii) වයඹ පළාතේ පාසල් අධ්‍යාපන කටයුතු සඳහා එම පළාත් සභාව මගින් 2010 වර්ෂයේ සිට මේ දක්වා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) 2012 වර්ෂයේදී එම පළාත් සභාව විසින් එක් පාසල් ශිෂ්‍යයෙකු වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අධ්‍යාපන අමාත්‍යතුමා,— ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය (ඉවත් කිරීමේ),— 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය පනත ඉවත් කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැළැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග (අංක 1),— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග (අංක 2),—1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 31 දිනැති අංක 1886/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.03.17 දින ඉදිරිපත් කළ නියෝග අනුමත කළ යුතු ය.

*3.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*10.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*11.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

12.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

18.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

චම්පික ප්‍රේමදාස ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**[1]**
''පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය'' යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---